## පුංචිම පුංචි සිතුවිලි

සුවඳ
පැන්
ටිකක්
ඉස්සම
ප්ලාස්ටික්
මල්
වුණත්
සුවඳයි.

-සිරිමල්-

## හිරු කුමරු

සාගර තලයෙන් ඈතක
නිම්හිම් සෙවූ කතරක
ජීවන ගංගාවේ ඉවුරක
අත්තටු සිඳී ගිය මොහොතක
තුන් සිත දැහැන්ගත වූ නිමේෂයක
හදවත් ගැස්ම නැවතු තත්පරයක
කිම ප්‍රියේ!
ඔබ මට
හමු වුණේ ..

වස්සාන සිහිනයක මා රඳවා ඔබ
භවතරණයෙ පුනරාගමනය අවදි කළ ඔබ
පරසතු උයනේ විසල් රුකක් වූ ඔබ
හිරු නුදුටු පුරවර හිරු කුමරු වූයේද ඔබ..

හමුවීමත් ගලනා කඳුලත් දුකක් නොවේවා
මේ සුපෙම් සිහිනය යළි බොඳ නොවේවා
පූජාසනයේ පිදූ මල් පර නොවේවා
ඔබ පිදූ ආදරය මියෙන තුරා මා සුරැකේවා..

**කාන්ති වික්‍රමසූරිය**




## නොමිලයේ දෙනු ලැබේ

නිවන් යනු රිසින් මේ
ආත්මයේදිම
ගිහි දිවිය තුල බැඳුම් අතහළ
හෙළ කුල කතකට අයත්
ඉතා වටිනා වස්තුවකි.

අඩ සියවසක් පැරණි
අඩ සියවස් අඩක්
ආදරයෙන් සුරැකි
ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත
ඔස්ට්‍රේලියාවේ
අළුත්වැඩියා කරන ලද්දකි.

කලක් පාවිච්චි නොකළමුත්
හොඳ ධාවන තත්වයේ ඇති
අඩු වියදම් සහිත
ආදායම් උල්පතකි.

පළමු ඉල්ලුම් කරුට
නොමිලේම දෙමි
මේ පුරුෂ රත්නය
පැවරිය හැකි නිවාස ණයත්
සමඟ!

**ශ්‍රියානි පෙරේරා**
සවුත්බෑන්ක්

## පහන් වැට

සංස්කරණය
**තුෂාරි ප්‍රියංගිකා**

## කෙම්බිමක් සොයා

හිරු ගෙවී ගිය එක් දිනක
මව්පියන් පා නමැද
කඳුළු හද පුරෝගෙන
කරදිය වළල්ලෙන් එපිට
සොයා පැමිණියෙමි
කෙම්බිමක පහස..

ගෙවූ හැම මොහොතකම
යැවූ හැම ලිපියකම
මව්පියන් සිහි වූ සඳ
ඉකි ගසයි ම හද
නොලැබ මව් බිමෙහි පහස ද..

යහමින් අතමිට සරු කොට
ජීවිතය විඳවන
ඩොලර් පසු පස දුවන
දුටුවෙමි මම ද
රොබෝවරු පිරුණු දේශය ..

බිරිඳගේ දුරකථන ඇමතුමෙන්
පවුල් කන සැමියා නිවස තුළ
දරුවන් තැන තැන ගාල් කර
මව්වරු ද හඹා යයි
ඩොලර් පසුපස

දහසක් සිතුවිලි වලින්
විමසයි හද ඉවසිල්ලෙන්
ජීවිතේ බැඳි මහද සිතුවම
අඳුරින් පිරි මෙපුර
හැකි වෙයිද විනිවිද දකින්නට
හෙට පහන් වන නැවුම් දින..

**පුෂ්පිකා ගමගේ**
රොක්ස්බර්ග් පාර්ක්

## චමත්කාරය

පැරණි රජ දහනක
සිත් පිත් නැති ගලක
නෙළූ බුදු පිළිමෙක
චමත්කාරය දැනේ මා හට

ළහිරු කිරණක
සොමි කැළුම් දහරක
දිලෙන තරු යායක
පා වෙන වළා කැටියක
චමත්කාරය දැනේ මා හට

මුහුදු රැල්ලේ
කන්ද මුදුනේ
ගලන නදියේ
වනේ වදුලේ
චමත්කාරය දැනේ මා හට

දියඹ ඔරුවේ
ගැලේ කවියේ
ගොපළු ගීයේ
කුරුළු රාවේ
චමත්කාරය දැනේ මා හට

ලපළු දල්ලක
සුපිපි කුසුමක
තුරු ලතාවක
සුළං රැල්ලක
චමත්කාරය දැනේ මා හට

ගම් පියස්සේ
ඇලේ ගඟුලේ
පැලේ රාවේ
සිඟිති ගීයේ
චමත්කාරය දැනේ මා හට

**සෙනෙහෙලතා රත්නායක**
clayton

කියවන්න... ලියන්න...
තොරතුරු දැන ගන්න..
www.ketapathpawra.com
වෙබ් අඩවියට ගොඩ වෙන්න..
සයිබර් අහසට ඔබේ නිර්මාණත්
ඉදිරිපත් කරන්නට
කැටපත් පවුරෙන් ඉඩක්.

ජීවිතය අනිත්‍ය වුවද
කුඩා කුරුල්ලා පවා
තමාටම කූඩුවක් සාදා
ගනියි

\- කොබයෂි ඉස්සා -